ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2020 අප්‍රේල් 24 |

## යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. හි ප්‍රාථමික අළෙවිකාරත්වය ඉවත්කර ගැනීම

යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. (මෙතැන් සිට යුනියන් බෑන්ක් ලෙස හැඳින්වෙන) විසින් කරන ලද ඉල්ලීමක් සලකා බලමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2020 මැයි මස 01 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි යුනියන් බැංකුවට සිය ප්‍රාථමික වෙළඳ මෙහෙයුම් කටයුතු නැවැත්වීමට අවසර ලබා දුන් බව මහජනතාවට මෙයින් දන්වා සිටී. යුනියන් බැංකුව විසින් LankaSettle පද්ධතියේ සෘජු අළෙවිකරු සහභාගීකරුවෙකු ලෙස ඉදිරියටත් කටයුතු කරනු ඇති අතර සිය ගණුදෙනුකරුවන් වෙනුවෙනුත් නිර්ලේඛනගත රජයේ සුරැකුම්පත් ගනුදෙනු සිදුකිරීම සහ සිය ගණුදෙනුකරුවන්ගේ ගිණුම් LankaSecure පද්ධතියේ පවත්වාගෙන යාම සිදුකරනු ඇත.

යුනියන් බැංකුව වෙත ඉහත අවසරය ලබාදෙන ලද්දේ එම බැංකුවේ හුදෙක් ව්‍යාපාරමය තීරණයක් මත පදනම්ව වන අතර, මෙමඟින් යුනියන් බැංකුවේ, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස සිදුකරන ක්‍රියාකාරකම්/සේවා සඳහා කිසිදු බලපෑමක් සිදු නොවන බව ශ්‍රී ලංකා මහ බැංකුව අවධාරණය කර සිටී.